**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අදියර III විභාගය - ජනවාරි 2025

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

## A කොටස

### ප්‍රශ්න අංක 01

මෙම න්‍යායාත්මක ප්‍රශ්නයෙන්, ලබා දී ඇති සිද්ධිය යටතේ සමාගමට සෘණාත්මකව බලපෑ හැකි ආර්ථික සාධක තුනක් පැහැදිලි කිරීමට අවශ්‍ය විය. සෑම අයදුම්කරුවෙකුම පාහේ ප්‍රශ්නයට පිළිතුරු දීමට උත්සාහ කළ අතර, වෙන් කර ඇති ලකුණුවල සාමාන්‍යයට වඩා ලබා ගැනීමට සමත් විය. කෙසේවෙතත්, ඇතැම් අයදුම්කරුවන් මෙම සිදුවීමට අදාළ නිශ්චිත ආර්ථික සාධක හඳුනා ගැනීම වෙනුවට දේශපාලන ගැටළු සහ අදාල නොවන මාතෘකා කෙරෙහි අවධානය යොමු කළහ.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය මගින් **සීමාසහිත Coco පොදු සමාගමට** අදාල සිදුවීම තුළ දැක්වෙන අභ්‍යන්තර අවදානම් දෙකක් පැහැදිලි කිරීම අයදුම්කරුවන්ගෙන් අවශ්‍ය විය. සෑම අයදුම්කරුවකුම පාහේ ප්‍රශ්නය උත්සාහ කළහ. කෙසේවෙතත්, සමාගමට විශේෂයෙන් අදාළ අවදානම් හඳුනාගෙන පැහැදිලි කළේ සාමාන්‍ය අයදුම්කරුවන් ප්‍රමාණයක් පමණි. බොහොමයක් අයදුම්කරුවන්ට ලකුණු අහිමි වූයේ ඔවුන්ගේ පිළිතුරු ඵලදායී ලෙස ප්‍රශ්නයට සම්බන්ධ නොවූ බැවිනි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය මධ්‍යස්ථ මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 03

මෙය මනාලෙස ව්‍යුහගත ප්‍රශ්නයක් වූ අතර විගණන ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා ඉටු කළ හැකි විගණන ක්‍රියාපටිපාටි වර්ග දෙකක් (2) එක් එක් විගණන ක්‍රියාපටිපාටි සඳහා උදාහරණ සහිතව පැහැදිලි කිරීමට අවශ්‍ය වූ අතර, අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කර තිබුණි. ඔවුන් විගණන ක්‍රියාපටිපාටි නිවැරදිව පැහැදිලි කළ නමුත් සමහර අයදුම්කරුවන් උදාහරණ දැක්වීමට අපොහොසත් වී තිබුණි. ඇතැම් අයදුම්කරුවන් හුදෙක් විස්තර සහ ඒවායේ වර්ගීකරණය පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය සරලව ප්‍රකාශ කර තිබූ අතර, ඒවා අභ්‍යන්තර හා බාහිර ලෙස වර්ගීකරණය කිරීම, ධනාත්මක හා සෘණාත්මක තහවුරු කිරීම පිළිබඳ දීර්ඝ පැහැදිලි කිරීම් ලබා දීම, විගණන සාක්ෂිවල අදාළත්වය සහ යෝග්‍යතාවය සාකච්ඡා කිරීම, අවදානම් ඇගයීම සහ එහි රාමුව වැනි දෑ දක්වමින් වැරදි පිළිතුරු ලබා දී තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතිණි.**

## ප්‍රශ්න අංක **04**

මෙම ප්‍රශ්නය මගින් සමාගමක තත්ත්වපාලන පද්ධතිය කෙරෙහි අවධානය යොමු කළේය. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කළ නමුත් **(a) කොටස** සඳහා තත්ත්ව පාලන පද්ධතියක මූලිකාංග දෙකක් හඳුනා ගැනීමට අවශ්‍ය වුවද, බොහොමයක් අයදුම්කරුවන් අදාළ නොවන පිළිතුරු ලබා දී තිබූ බැවින් මෙම කොටස සඳහා සුළු අයදුම්කරුවන් පිරිසක් සම්පූර්ණ ලකුණු ලබා ගත්හ. **(b) කොටසින්** කාර්යාභාර කාර්යාසාධනයේ තත්ත්ව පාලනයේ අඛණ්ඩතාවය පවත්වා ගැනීම සඳහා විගණන ආයතනයක් විසින් අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳව විමසා ඇති අතර, අයදුම්කරුවන් කිහිප දෙනෙකු දුර්වල අවබෝධයක් සහිතව පිළිතුරු සැපයීමට උත්සාහ කරන ලදී. පිළිතුරු සතුටුදායක මට්ටමක නොතිබුණි. නිරීක්ෂණය කරන ලද පොදු දුර්වලතා වූයේ විෂය ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධයක් නොමැති කම, ස්ව-අධ්‍යයන පොත පරිශීලනය දුර්වල වීම සහ ආයතන මට්ටමින් තත්ත්ව පාලනය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොතිබීමයි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## B කොටස

මෙම කොටස ලකුණු 10 බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න තුනකින් සමන්විත විය.

## ප්‍රශ්න අංක **05**

මෙය කොටස් තුනකින් සමන්විත ලකුණු 10 ක ප්‍රශ්නයකි.

(a) ප්‍රශ්නයේ මෙම කොටස සඳහා අයදුම්කරුවන් සාමාන්‍ය ලකුණට වඩා වැඩි ලකුණු ලබා ගත්හ. කෙසේවෙතත්, ඔවුන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රායෝගික සිදුවීම් සඳහා න්‍යායාත්මක දැනුම යෙදීවීමේ අභියෝගවලට මුහුණ දී තිබුණි. අයදුම්කරුවන් බොහොමයක් වැරදි ලෙස දක්වා තිබුනේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතා සහිත සමාගම් දෙකක එකම අධ්‍යක්ෂකවරයෙකු සිටීම පාලන අවදානම් මූල්‍ය හෝ මෙහෙයුම් අවදානම් සමඟ වැරදි ලෙස සම්බන්ධ කර තිබුණි. මීට අමතරව, ඔවුන්ගේ පිළිතුරුවල ප්‍රමාණවත් සාධාරණීකරණයක් සහ විවේචනාත්මක විශ්ලේෂණයක් නොතිබූ අතර, LKAS 1 සහ SLAuS 570 වැනි අදාළ ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් ප්‍රමාණවත් ලෙස අදාල කිරීමට හැකියාව අපොහොසත් වී තිබුණි. මෙම අධීක්ෂණය මගින් ආයතනයක අඛණ්ඩ පැවැත්ම පවත්වාගෙන යාමේ හැකියාව කෙරෙහි බලපාන ප්‍රාථමික සාධක පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය ඉස්මතු විය.

(b) මෙය සම්බන්ධිත පාර්ශවයකට ලබා දී ඇති ණය විගණනය කිරීමේදී ඉටු කළ යුතු විගණන ක්‍රියා පටිපාටි පිළිබඳ සරල න්‍යායාත්මක ප්‍රශ්නයකි. කෙසේවෙතත්, බොහොමයක් අයදුම්කරුවන් BCC සම්බන්ධිත පාර්ශවයක් ලෙස හඳුනා නොගත් බැවින් දුර්වල ලෙස පිළිතුරු සපයා තිබුණි. සම්බන්ධිත පාර්ශව ශේෂයන් තහවුරු කිරීම සඳහා කළ යුතු විගණන ක්‍රියා පටිපාටි බොහෝ දෙනෙකුට නුහුරු විය.

(c) බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නය වරදවා වටහාගෙන අදාළ නොවන පිළිතුරු ලබා දී අඩු ලකුණු ලබා ගත්හ. කිහිප දෙනෙක් අදාළ නොවන තොරතුරු ඇතුලත් කර දීර්ඝ පැහැදිලි කිරීම් ලබා දුන් බැවින් ඔවුන්ගේ දැනුම හා න්‍යායාත්මක අවබෝධය නොමැතිකම පිළිබිඹු විය. සිද්ධි අධ්‍යනය මත පදනම් වූ ප්‍රශ්න සමග ප්‍රමාණවත් පුහුණුවක් නොතිබීම සහ පිළිතුරු නිසි පරිදි ව්‍යුහගත නොකිරීම තුලින් පිළිතුරු වල පැහැදිලිකම, තාක්ෂණික නිරවද්‍යතාවය සහ අදාළ ප්‍රමිතීන්ට නිසි ලෙස අදාල කරගැනීම සහතික කිරීමට අපොසෙත් වීම නිසා මෙම තත්වය තවත් උග්‍ර විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය දුර්වල මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 06

**(a)** මෙම ප්‍රශ්නය මගින් ආචාර ධර්ම වල මූලික මූලධර්ම සහ ලබා දී ඇති සිදුවීමක හඳුනාගත් තර්ජන අඩු කිරීමට/ඉවත් කිරීමට ගත හැකි පියවර පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. එය තරමක් හොඳ ප්‍රශ්නයක් විය.

බොහොමයක් අයදුම්කරුවන්ට ස්වාධීනත්වය, අරමුණුගතභාවය සහ අවංක බව යන සංකල්ප පිළිබඳව මනා හුරුවක් තිබූ අතර, ඒ හා සම්බන්ධ තර්ජන සාර්ථකව විස්තර කර වෙන්කර තිබූ ලකුණුවල සාමාන්‍ය අගයට ලකුණු වලට වඩා ලකුණු ලබා ගත්හ

කෙසේ වෙතත්, ඇතැම් අයදුම්කරුවන් තර්ජන මූලික මූලධර්ම සමග පටලවා ගත් අතර නව බදු ව්‍යාපාරය සහ බදු ගණනය කිරීම පිළියෙළ කිරීමේදී ගණකාධිකාරීවරයාට **සචින්** සහාය දැක්වීම හේතුවෙන් බිය ගැන්වීමේ තර්ජන සහ උපදේශන මත තර්ජනය වැනි තර්ජන වැරදි ලෙස හඳුනා ගත්හ. ඇතැම් අයදුම්කරුවන් නව බදු නීති හඳුන්වා දීම වැනි අදාළ නොවන මාතෘකා සාකච්ඡා කරමින් එය සිදුවීමට සම්බන්ධ නොකර න්‍යායාත්මක දැනුම යොදවා තිබුණි.

**(b)** ස්වයං ඇල්ම මත තර්ජන, ස්වයං සමාලෝචනය සහ සුහදශීලීවීම වැනි තර්ජන අවම කිරීම සඳහා ස්ථාපිත කළ යුතු පියවර සඳහන් කරමින් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා තිබුණි..

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත වූ අතර, **(a) කොටස** මගින් විස්තර කර ඇති සිදුවීමට අදාලව ප්‍රමාණාත්මක හා පෘථුල වෙනස්කම් පැවතීම නිසා විගණක මතය විකරණය කිරීම කෙරෙහි අවධානය යොමු විය. අයදුම්කරුවන්ට පරීක්ෂකගේ අපේක්ෂාවන් මුළුමනින්ම අවබෝධ කර ගැනීමට අභියෝගයක් වූ අතර, ඔවුන් තොග තක්සේරු කිරීම හා සම්බන්ධ නොගලපන ලද ප්‍රමාණාත්මක වෙනස්කම්වල බලපෑම විස්තර කර තිබුණි. පාඩුවක් ලෙස දැක්වූ ලාභයෙහි ඇති බලපෑම, සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන සඳහා බලපෑම වැනි විගණන ප්‍රමිතීන්ට අදාළව ප්‍රමාණාත්මක මට්ටම් සහ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවල වැදගත්කම අවධාරණය කිරීමට ඇතැම් අයදුම්කරුවන් අපොහොසත් විය. අයදුම්කරුවන් කිහිප දෙනෙකු සාවද්‍ය ප්‍රකාශන වල සමස්ත බලපෑම විමසනවා වෙනුවට වැරදි ලෙස ද්‍රව්‍ය හෝ තොග අයිතමවල මිල සහ ඒවායේ බලපෑම කෙරෙහි අවධානය යොමු කළ අතර, ඇතැම් අයදුම්කරුවන් අහිතකර මතයක් නිකුත් කිරීමට යෝජනා කළ අතර අනෙකුන් අයදුම්කරුවන් කාර්යභාර හවුල්කරුගේ අභිමතය මත පදනම්ව එය විකරණය කිරීම හෝ තත්ත්වාගණනය කළ මතයක් දීම නිර්දේශ කළහ.

**(b) කොටස** විගණන වාර්තාවක මූලිකාංග පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම ඇගයීම අරමුණු කර තිබුණි. සපයා ඇති සිදුවීම නොසලකා මූලිකාංග නොවෙනස්වන බැවින් බොහෝ අයදුම්කරුවන් මෙම කොටස සඳහා හොඳින් පිළිතුරු සපයා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය මධ්‍යස්ථ මට්ටමක පැවතුණි.**

## C කොටස

මෙම කොටස ලකුණු 25 බැගින් වූ අවස්ථා සම්බන්ධ, අනිවාර්ය ප්‍රශ්න දෙකකින් සමන්විත විය.

### ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නය කොටස් 5 කින් සමන්විත ලකුණු 25 ක ප්‍රශ්නයකි. නිෂ්පාදන පරිසරයක් තුළ විගණනය පිළිබඳ අයදුම්කරුවන්ගේ අවබෝධය තක්සේරු කිරීම, ක්‍රියාවලි සහ අභ්‍යන්තර පාලනයන් කෙරෙහි අවධානය යොමු කිරීම, ඒ සඳහා න්‍යායික දැනුම යෙදීම සහ අභ්‍යන්තර විගණන කණ්ඩායම විසින් හඳුනාගෙන ඇති කරුණු ඇගයීම මෙම ප්‍රශ්නය මගින් අවශ්‍ය විය.

**(a)** ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාවලීන් හඳුනා ගැනීමට අවශ්‍ය විය.

**(b)** නිර්දේශ සහිතව පවතින පාලනයන්ගේ දුර්වලතා හඳුනා ගැනීමට අවශ්‍ය විය.

**(c)** ස්ථාපිත කළ යුතු පාලන ක්‍රියාකාරකම් පැහැදිලි කිරීමට අවශ්‍ය විය.

**(d)** වැඩසටහන්වලට අනවසර වෙනස්කම් වැළැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා භාවිතා කල හැකි පොදු පාලනයන් සඳහා උදාහරණ දැක්වීමට අවශ්‍ය විය.

**(e)** පොදුවේ ඕනෑම අභ්‍යන්තර පාලන ක්‍රමයක දුර්වලතා ඇති කිරීමට තුඩු දෙන සංඥා ප්‍රකාශ කිරීමට අවශ්‍ය විය.

පිළිතුරුවලින් පෙන්නුම් කරන ලද්දේ බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයේ ව්‍යුහය සම්බන්ධව හුරුපුරුදු බවයි. බොහෝ දෙනා ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කළ අතර **(a), (b)** සහ **(d)** කොටස් සඳහා හොඳින් පිළිතුරු සපයා තිබුණි. වැරදි වැටහීම් හෝ මෙම විශේෂිත ක්ෂේත්‍ර සමඟ හුරුපුරුදු නොවීම හේතුවෙන් **(c)** සහ **(e)** කොටස් සඳහා පිළිතුරු දුර්වල විය.

**(a)** බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කර ක්‍රියාවලීන් නිවැරදිව හඳුනාගත් අතර, ඇතැම් අයදුම්කරුවන් තරමක් වෙනස් සිංහල තාක්ෂණික වචන භාවිතා කළහ. බහුතර අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ලබා ගත්හ.

**(b)** බොහොමයක් අයදුම්කරුවන් මෙම කොටසට පිළිතුරු සැපයීමට උත්සාහ කළ අතර, අභ්‍යන්තර පාලන දුර්වලතා හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්දේශ යෝජනා කිරීමෙන් සුදුසු පිළිතුරු සපයා වෙන්කර ඇති ලකුණු සාමාන්‍යයට වඩා ලබා ගැනීමට සමත් විය. කෙසේවෙතත්, වැරදි වැටහීමක් හේතුවෙන් අයදුම්කරුවන් කිහිප දෙනෙකු ඔවුන්ගේ **(a) කොටසෙහි** පිළිතුරු නැවත දක්වා තිබුණි.

**(c)** අයදුම්කරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් ප්‍රශ්නයේ මෙම කොටසට පිළිතුරු සැපයීමට උත්සාහ කළද, උත්තර සාමාන්‍යයෙන් දුර්වල විය. බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නය තේරුම් ගැනීමට අපොහොසත් වූ අතර, අදාළ නොවන තොරතුරු සැපයීම සඳහා කාලය නාස්ති කර තිබුණි.

**(d)** මෙය සරල පොදු ප්‍රශ්නයක් වූ බැවින් බොහෝ අයදුම්කරුවන් මෙම කොටසට පිළිතුරු සැපයීමට උත්සාහ කළ අතර, නිවැරදි පිළිතුරු ලබා දුන්හ. මෙය සමාන වර්ගයේ පශ්න නැවත අසන්නේ නැතිව අයදුම්කරුවන්ගේ දැනුම තක්සේරු කිරීම සඳහා මනාව ව්‍යුහගත කළ ප්‍රශ්නයකි.

**(e)** මෙය සමාන වර්ගයේ ප්‍රශ්න නැවත අසන්නේ නැතිව අයදුම්කරුවන්ගේ දැනුම තක්සේරු කිරීමට මනාව ව්‍යුහගත කළ ප්‍රශ්නයකි. ඇතැම් අයදුම්කරුවන් ව්‍යාකුල වූ අතර අදාළ නොවන පිළිතුරු ලබා දුන්හ. අයදුම්කරුවන් කිහිප දෙනෙක් සම්පූර්ණ ලකුණු ලබා ගත්හ.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතිණි.**

## ප්‍රශ්න අංක 09

මෙය සිදුවීමක් මත පදනම් වූ ලකුණු 25 ක ප්‍රශ්නයක් වූ අතර එය ප්‍රධාන ක්ෂේත්‍රවල අයදුම්කරුවන්ගේ විගණන දැනුම සහ කුසලතා තක්සේරු කිරීම සඳහා නිර්මාණය කර තිබුණි. සැලසුම් කිරීමේ වැදගත්කම, සපයා ඇති තොරතුරු මත පදනම්ව **Malcom පොදු සමාගමෙහි** අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගැනීම, සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක් සහ සීමිත සහතික වීමේ කාර්යභාරයක් අතර වෙනස, වංචනික මූල්‍ය වාර්තාකරණය, වංචා වැළැක්වීම සහ අනාවරණය කර ගැනීම ගැනීම සම්බන්ධයෙන් **Malcom පොදු සමාගමෙහි** කළමනාකාරීත්වයේ වගකීම, ලබා ගත් තොරතුරු කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිවයුතු පාර්ශවයන් සමග සන්නිවේදනය එයට ඇතුළත් විය.

(a) බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කළ අතර තරමක් හොඳ පිළිතුරු සපයා තිබුණි. කෙසේ වෙතත්, ඇතැම් අයදුම්කරුවන් ප්‍රශ්නය වරදවා වටහා ගැනීම නිසා සපයා ඇති සිදුවීමට අදාල අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගැනීමට අපොහොසත් විය. ඔවුන් මූල්‍ය දෙපාර්තමේන්තුව, මානව සම්පත් අංශය, කළමනාකරණය යනාදී අංශ වලට අදාල වන පරිදි නොගැලපෙන පිළිතුරු සපයා තිබුණි. ඇතැමුන් පොදු පිළිතුරු ලබා දුන් අතර, ලබා දී ඇති සිදුවීමට සම්බන්ධ නොකර මුදල් වැනි ක්ෂේත්‍ර සඳහන් කර තිබුණි.

(b) අයදුම්කරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් සාධාරණ හා සීමිත සහතික කිරීමේ කාර්යභාරයන් අතර වෙනස්කම් නිසි පරිදි පැහැදිලි කළ අතර හොඳ ලකුණු ලබා ගත්හ.

(c) ඇතැම් අයදුම්කරුවන් මෙහි විශේෂයෙන් සපයා ඇති විගණනය පිළිබඳව සඳහන් නොකර විගණන ආයතනයේ දෘෂ්ටි කෝණයෙන් පොදු පිළිතුරු ලබා දුන්හ. කෙසේ වෙතත්, අයදුම්කරුවන්ගෙන් බහුතරයක් සාර්ථකව ඔවුන්ගේ පිළිතුරු සපයා ඇති කරුණු සමඟ සම්බන්ධ කර තිබුණි. කෙසේ වෙතත්, විගණන සැලසුම් කිරීම විගණන ආයතනයෙහි කාර්යක්ෂමතාව සහ ලාභදායිතාව වැඩි දියුණු කරන බව, කළමනාකරණයට සුමටව ක්‍රියාත්මක කිරීමට උපකාරී වන බව, නැතහොත් වංචා වැළැක්වීම වැනි අදාළ නොවන පිළිතුරු ද ලබා දී තිබුණි.

(d) (i) බොහොමයක් අයදුම්කරුවන්ගේ පොදු දැනුම භාවිතා කරමින් මෙයට පිළිතුරු දුන් අතර, "වංචාව" යන වචනය සරලව පැහැදිලි කිරීමෙන් ලකුණු කිහිපයක් ලබා ගත්හ. මූල්‍ය ප්‍රකාශන ව්‍යාජ ලෙස සකස් කිරීම සඳහා මුල්‍ය වාර්තා වෙනස් කිරීම වැනි පුද්ගලික ප්‍රතිලාභ සඳහා හිතාමතාම තොරතුරු හැසිරවීම ලෙස බහුතරයක් නිවැරදිව පැහැදිලි කර තිබුණි. කෙසේවෙතත්, අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් "හිතාමතාම" යන වචනය පැහැදිලිව භාවිතා කිරීමට අපොහොසත් වූ අතර ඒ වෙනුවට සපයා තිබුණු "වංචනික" යන වචනය මත විශ්වාසය තබා සිටියහ.

(ii) බහුතරය මෙම කොටසට පිළිතුරු සැපයීමට උත්සාහ කළේ නැත. කෙසේ වෙතත්, හොඳින් පිළිතුරු සැපයූ අය, වංචා වැළැක්වීම සහ හඳුනා ගැනීම කළමනාකරණයේ වගකීම බව නිවැරදිව ප්‍රකාශ කළ අතර එමඟින් ලකුණු ලබා ගත්හ.

(e) මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය වූයේ කළමනාකාරීත්වයට සහ පාලනය සඳහා වගකිවයුතු පාර්ශවයන්ට සන්නිවේදනය කළ යුතු කරුණු පැහැදිලි කිරීමයි. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ නොකළ අතර සෙසු අය විසින් සපයන ලද පිළිතුරු පොදුවේ ගත් විට දුර්වල විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය දුර්වල මට්ටමක පැවතුණි.**

\- - -

**විභාගයේදී උත්තර ලිවීමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

- අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත අධ්‍යයනය කොට එහි අන්තර්ගතය මනාව වටහාගත යුතුය.
- විගණන විෂයට සම්බන්ධ ලිපි, පොත්පත්, සඟරා, ආදිය පරිශීලනය කළ යුතුය.
- ප්‍රශ්න පත්‍රයට අමුණා ඇති "කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව" පිළිබඳ නිර්වචන හරිහැටි තේරුම්ගෙන එපරිදි උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යතුය.
- පසුගිය ප්‍රශ්නපත්‍ර වල අන්තර්ගත දෑ අධ්‍යයනය කර, යටත් පිරිසෙයින් ඉකුත් විභාගවල ප්‍රශ්නවලටවත් උත්තර ලිවීමට පුරුදු වී, ප්‍රශ්න දී තිබෙන ආකාරය වටහා ගැනීමට උත්සාහ කළ යුතුය.
- ප්‍රශ්න පත්‍ර වල පරික්ෂා කර ඇති න්‍යායාත්මක කරුණු යොදා ගැනීම විභාගයේදී පරීක්ෂක විසන් අපේක්ෂා කර ඇත්තේ කෙසේද යන සම්බන්ධතාවය අයදුම්කරුවන් වටහාගත යුතුය.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ කවර ක්ෂේත්‍රවලින් පසුගිය ප්‍රශ්න දී තිබේදැයි කෙටි සටහන් ලියාගැනීම මගින් අයදුම්කරුවන් තේරුම්ගත යුතුය.
- ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට කාලය වෙන්කරගෙන ඒ අනුව උත්තර ලියා පරුදු වීමෙන් විභාගයේදී අයදුම්කරුවන්ගේ කාල කළමනාකරණය දියුණු වනු ඇත.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ එක් එක් පරිච්ඡේදය සඳහා කෙටි සටහන් පිළියෙල කරගෙන විවේක ලැබෙන විධියට විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු මතකයට නගා ගැනීම සිදුකළ යුතුය.
- අයදුම්කරුවන් කියවීමට හැකි ආකාරයෙන් අත්අකුරු පැහැදිලිව විභාගයේදී ලිවිය යුතුය.
- ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම පටන්ගැනීමට පෙර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරික්ෂාකාරීව කියවා බැලිය යුතුය.
- ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගැනීමටත්, ඒවාට අවශ්‍යකරන යෝග්‍ය උත්තර නිවැරදිව ලිවීමටත් පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් අයදුම්කරුවන් සතුවිය යුතුය.
- වෙන්කර ඇති ලකුණු මත පදනම්ව, ප්‍රශ්නවලට කාලය වෙන්කර ගැනීමෙන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති ප්‍රශ්න වලට එලදායී අන්දමින් උත්තර සැපයීමට අයදුම්කරුවන්ට හැකිවනු ඇත.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති ආකාරයටම උත්තරවලද යෝග්‍ය පරිදි නිවැරදි ලෙස අංක යෙදිය යුතුය.
- න්‍යායයන් හා ඒවා ප්‍රශ්නයට යොදාගැනීම අතර සම්බන්ධය වටහා ගැනීම ඉතාමත් වැදගත්වන අතර, ඉල්ලා ඇති අවස්ථාවන්හි උදාහරණ සහිතව ලිවිය යුතුය.
- උත්තර පොත් බාර දීමට පෙර, අවශ්‍ය කරන ප්‍රශ්න සියල්ලටම උත්තර ලියා තිබේද, යෝග්‍ය පරිදි අංක යොදා තිබේදැයි දෙවරක් පරීක්ෂා කර බලන්න.

\- * * * -